# භාණ්ඩ විකිණීමේ නීතිය

## විෂය නිර්දේශය මත බර තැබීම 15 %

### පරිච්ඡේද අන්තර්ගතය

- හැඳින්වීම
- භාණ්ඩ වර්ගීකරණය
- කොන්දේසි සහ ප්‍රතිඥාභාර
- විකුණුම්කරු හා ගැනුම්කරු අතර අයිතිය හුවමාරු වීම
- භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඉටුකිරීම
- භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් කඩකිරීමකදී ගතහැකි නීත්‍යානුකූල පියවර හා පිලියම්

සැකසුම - කේ.ඩී. ප්‍රභාත් විජයසිරි ( LLB ) ( AAL )

## භාණ්ඩ විකිණීම හා සම්බන්ධ නීති හඳුන්වා දීම

භාණ්ඩ විකිණීමේ නීතිය සම්බන්ධයෙන් මෙරටදී අදාල වන ප්‍රධාන ව්‍යවස්ථාපිත නීතිය වන්නේ 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතයි. මෙය .................................... මත පදනම්ව ඇත.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 2 (1 ) වගන්තියට අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යනු මිල යැයි හඳුන්වනු ලබන මූල්‍ය ප්‍රතිෂ්ඨාවකට , භාණ්ඩ වල හිමිකම, විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත පැවරීමේ හෝ පැවරීමට එකඟ වීමේ ගිවිසුමක් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ලෙස හැඳින්වේ.

ඒ අනුව මෙම නිර්වචනය අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යන අර්ථයට භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් මෙන්ම, භාණ්ඩ විකිණීමට එකඟවීමේ ගිවිසුමක්ද ඇතුලත්ය.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 2 (2 ) වගන්තියට අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමකදී භාණ්ඩයේ අයිතිය විකුණුම්කරුගෙන් ගැනුම්කරු වෙත පැවරෙන අතර එහි 2 ( 3 ) වගන්තිය අනුව විකිණීමට එකඟවීමේ ගිවිසුමකදී භාණ්ඩයේ අයිතිය විකුණුම්කරුගෙන් ගැනුම්කරු වෙත පැවරෙන්නේ අනාගත දිනයකදී හෝ පසුව ඉටුකල යුතු කොන්දේසියකට යටත්ව ය.

එමනිසා,

භාණ්ඩ විකිණීමට එකඟවීමේ ගිවිසුමක්, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් බවට පත් වන්නේ භාණ්ඩයේ අයිතිය ( හිමිකම ) පැවරීමේ හේතූන්ට යටත්ව,

❤❤ කාලය ගෙවී යාම හෝ ❤❤ කොන්දේසි සම්පූර්ණ වීම මතය.

### භාණ්ඩ විකිණීමට එකඟවීමේ ගිවිසුමක් සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් අතර වෙනස්කම්

| භාණ්ඩ විකිණීමේ ගිවිසුම | භාණ්ඩ විකිණීමට එකඟවීමේ ගිවිසුමක් |
|---|---|
| ❖භාණ්ඩ වල අයිතිය ගැනුම්කරුට පැවරේ. | ❖භාණ්ඩ වල අයිතිය තවදුරටත් විකුණුම්කරු සතුවේ. |
| ❖භාණ්ඩ වල භුක්තිය ගැනුම්කරුට ලැබේ. | ❖භාණ්ඩ වල භුක්තිය තවදුරටත් විකුණුම්කරු සතුවේ. |
| ❖භාණ්ඩයට සිදුවන අලාභ ගැනුම්කරු - -විසින් දරා ගත යුතුය. | ❖ භාණ්ඩයට සිදුවන අලාභ විකුණුම්කරු විසින් - දරා ගත යුතුය. |
| උදා - .................................................. | උදා - .................................................................. |

◈◈ වැඩ සහ අමුද්‍රව්‍ය සඳහා වන ගිවිසුමක්, භාණ්ඩ විකිණීමේ ගිවිසුමකින් පැහැදිලිවම වෙනස් වේ. යමෙකුගේ දක්ෂතාවය හෝ නිපුනතාවය මූලික කරගත් ගිවිසුමක්, වැඩ සහ අමුද්‍රව්‍ය සඳහා වන ගිවිසුමක් හෙවත් වැඩ සහ සේවා සැපයීම සඳහා වන ගිවිසුමක් ලෙස සැලකේ. ◈ උදාහරණ -

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

**වැඩ සහ අමුද්‍රව්‍ය සඳහා වන ගිවිසුමක් සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් අතර වෙනස්කම්**

| භාණ්ඩ විකිණීමේ ගිවිසුම | වැඩ සහ අමුද්‍රව්‍ය සඳහා වන ගිවිසුම |
|---|---|
| භාණ්ඩය ප්‍රමුඛ කොට සැලකේ. | සේවය ප්‍රමුඛ කොට සැලකේ. |
| භාණ්ඩ විකිණීමේ නීතිය අදාල වේ. | සාමාන්‍ය ගිවිසුම් නීතිය අදාල වේ. |

පහත සඳහන් ආකාර වලට වලංගු භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති විය හැකිය.

- ලිඛිතව
- වාචිකව
- කොටසක් ලිඛිතව සහ කොටසක් වාචිකව
- ව්‍යංගයෙන්

**භාණ්ඩ විකිණීමේ ගිවිසුමක " මිල "** යන්න, පාර්ශවයන් අතර නියම කරනු ලැබූ හෝ , නියම කිරීමට ඉඩ දෙනු ලැබූ හෝ කේවල් කිරීමේදී තීරණය කරගනු ලැබූ හෝ එකක් විය හැකිය. එලෙස භාණ්ඩයේ මිල තීරණය කර නැතිනම්, අවස්ථානෝචිතව ගැනුම්කරු විසින් විකුණුම්කරුට සාධාරණ මිලක් ගෙවිය යුතුය.

**භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව** වන "භාණ්ඩ" යන්නට මුදල් හැර වෙනත් ඕනෑම චංචල දේපලක් අයත් වේ. මේ නිර්වචනය අනුව රථවාහන, ගෑස් සිලින්ඩර, පරිඝනක, පිදුරු, පස්, ගොඩනැගිලි සුන්බුන් මෙන්ම පෞරානික වටිනාකමක් ඇති මුදල් ද භාණ්ඩ යන අර්ථ නිරූපනය තුලට ඇතුලත්ය. එමෙන්ම නඩු තීරණ නීතිය අනුව පෙනී යන්නේ තවමත් වැඩෙමින් පවතින අස්වැන්න, විකිණීමට පෙර ඉඩමෙන් ඉවත් කර ගැනීමට එකඟ වූ ඉඩමට සවි වූ දේපලද "භාණ්ඩ" යන නිර්වචනය තුලට ඇතුලත් බවයි. එහෙත්, සමාගම් කොටස්, ලොතරැයි වැනි අස්පෘශ්‍ය වත්කම් "භාණ්ඩ" යන නිර්වචනය තුලට ඇතුලත් නොවේ.

**භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ප්‍රතිශ්ඨාව**, මූල්‍ය ප්‍රතිශ්ඨාවක් විය යුතුය. එනම් සම්පූර්ණ ප්‍රතිශ්ඨාවම හෝ ප්‍රතිශ්ඨාවෙන් කොටසක් වත් මුදල් වලින් හුවමාරු විය යුතුය. ඒ අනුව භාණ්ඩ හුවමාරු කරන ගිවිසුම්, භාණ්ඩ විකිණීමේ ගිවිසුම් යන අර්ථයට ඇතුලත් නොවේ. උදා -

X විසින් Y ට තම කාර් රථය පැවරීමටත්, ඒ වෙනුවට Y විසින් ඔහුගේ වෑන් රථය X වෙත පැවරීමටත් X සහ Y ගිවිසුමක් ඇති වේ යැයි සිතන්න. මෙහිදී එම දෙපාර්ශවය අතර මුදල් හුවමාරු වීමක් නොවන බැවින් මෙය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් නොවේ. ඒ අනුව භාණ්ඩ විකිණීමේ ආඥාපනත අදාල නොවේ. එහිදී අදාල වන්නේ ..........................................................................

ඉහත උදාහරණයේම X විසින් Y ට තම කාර් රථය පැවරීමටත්, ඒ වෙනුවට Y විසින් ඔහුගේ වෑන් රථය සහ මුදලින් රුපියල් ලක්ෂයක් X වෙත ලබාදීමටත් එම දෙපාර්ශවය අතර ගිවිසුමක් ඇති වූයේ නම් එහිදී එම දෙපාර්ශවය අතර භාණ්ඩය සමග මුදල් හුවමාරු වීමක් සිදුවන බැවින් භාණ්ඩ විකිණීමේ ආඥාපනත අදාල වේ.

## <u>භාණ්ඩ විකිණීමේ ගිවිසුමක නියම / කරුණු / වගන්ති</u>

### <u>කොන්දේසි සහ ප්‍රතිඥාභාර</u>

ගිවිසුමක ඇති වගන්ති වැදගත්කම අනුව කොටස් දෙකකට බෙදේ. **<u>සාපේක්ෂව වැදගත්කම වැඩි වගන්ති කොන්දේසි ලෙසත්, සාපේක්ෂව වැදගත්කම අඩු වගන්ති ප්‍රතිඥාභාර ලෙසත් හැඳින්වේ.</u>**

**කොන්දේසියක් කඩවීමකදී අහිංසක පාර්ශවයට <u>( ස්වකීය අභිමතය පරිදි )</u> ලබාගතහැකි සහන**

- ගිවිසුම අවසන් කිරීම
- ගිවිසුම ප්‍රකාර තම බැඳීම් ඉටුකිරීම ප්‍රතික්ෂේප කිරීම
- සිදුවූ හානි සඳහා වන්දි අයකර ගැනීම ( ගිවිසුම කඩ කළ පාර්ශවය වෙතින් )

❄❄ එහෙත් ගිවිසුමක **ප්‍රතිඥාභාරයක් කඩවූ විට අහිංසක පාර්ශවයට ලබාගත හැකි එකම සහනය වන්නේ අලාභ අය කර ගැනීම පමණි.** එනම්, ප්‍රතිඥාභාරයක් කඩවූ පමණින්ම ගිවිසුමක් අවසන් නොවේ. එවන් අවස්ථාවකදී ගිවිසුම තවදුරටත් වලංගුය. ❄❄

**භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යටතේ කොන්දේසි කඩවීමක්, ප්‍රතිඥාභාර කඩවීමක් ලෙස සැලකිය හැකි අවස්ථා**

→ ගැනුම්කරු විසින් කොන්දේසිය අතහැර දමා ඇතිවිට

→ කොන්දේසියක් කඩකල විට එය ප්‍රතිඥාභාරයක් කඩවීමක් ලෙස සැලකීමට ගැනුම්කරු තම කැමැත්ත ප්‍රකාශ කොට ඇති විට

→ ඉටුකල නොහැකි වීම හෝ වෙනත් හේතුවක් මත එම කොන්දේසිය ඉටු නොකර සිටීමට නීතියෙන් අවසර ඇති විට

→ වෙනත් ආකාරයකට සඳහන් නොවේ නම් නිශ්චිත භාණ්ඩ විකිණීම සඳහා ඇතිකර ගත් ගිවිසුමකදී භාණ්ඩයේ අයිතිය ගැනුම්කරුට මාරුවී ඇත්නම් කොන්දේසි කඩ වීමක්, ප්‍රතිඥාභාර කඩවීමක් ලෙස සැලකිය හැකිය.

→ වෙනත් ආකාරයකට සඳහන් නොවේ නම් ගිවිසුමේ සංයුතිය අනුව කොටස් වශයෙන් වෙන් කල නොහැකි භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ගැනුම්කරු, භාණ්ඩ සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් භාරගෙන ඇති අවස්ථාවක කොන්දේසි කඩ වීමක්, ප්‍රතිඥාභාර කඩවීමක් ලෙස සැලකිය හැකිය.

**අනාමික නියමයන්**

ගිවිසුමක ඇති යම් වගන්තියක් කොන්දේසියක් සහ ප්‍රතිඥාභාරයක් අතරමැද ස්වරූපයක් ගන්නා විට එය අනාමික නියමයක් ලෙෂ හැඳින්වේ. **හොංකොං ෆර් ෂිපිං එරෙහිව ෆර්හැම්** නඩුවේදී මුල් වරට මෙම අනාමික නියම පිලිබඳව සාකච්ඡා විය.

ඒ අනුව එවන් අනාමික නියමයක් ගැඹුරින් විශ්ලේෂණය කිරීමේදී එය සාපේක්ෂව වැදගත්කමින් වැඩි දෙයක් ලෙස සැලකිය හැකිනම් එය කොන්දේසියක් ලෙසද, එය සාපේක්ෂව වැදගත්කමින් අඩු දෙයක් ලෙස සැලකිය හැකිනම් එය ප්‍රතිඥාභාරයක් ලෙස සැලකිය යුතුය.

**භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ඇතුලත් වටහාගත යුතු ( ව්‍යංග ) කරුණු**

**1. විකුණුම්කරුගේ හිමිකමට අදාල ව්‍යංග කරුණු**

( අ ) භාණ්ඩ විකිණීමකදී විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් ඇති බවට **ව්‍යංග කොන්දේසියක්** ඇත.

( ආ ) භාණ්ඩ විකිණීමට එකඟවීමකදී භාණ්ඩයේ අයිතිය ගැනුම්කරුට පැවරෙන අවස්ථාවේදී එම භාණ්ඩය විකිණීම සඳහා විකුණුම්කරුට අයිතියක් ඇති බවට **ව්‍යංග කොන්දේසියක්** ඇත.

උදා - ඒ ට අයත් මෝටර් රථයක් බී විසින් සොරාගෙන සී ට විකුණයි නම්, එම විකිණීමේදී මෙම ව්‍යංග කොන්දේසිය කඩ වී ඇත. ඊට හේතුව වන්නේ බී එම මෝටර් රථයේ අයිතිකරු හෝ අයිතිකරුගේ බලයලත් නියෝජිතයා නොවන බැවින් බී ට එම මෝටර් රථය විකිණීමට හිමිකමක් නොමැතිවීමයි.

ඇ) භාණ්ඩ ගැනුම්කරුට භාණ්ඩ වල නිරවුල් භුක්තිය ලැබීමටත්, භුක්ති විඳීමට හැකිවිය යුතු බවටත් **<u>ව්‍යංග ප්‍රතිඥාභාරයක්</u>** ඇත.

ඈ) භාණ්ඩ විකිණීමේ ගිවිසුමට එළඹීමට පෙර ගැනුම්කරු නොදැන සිටි තෙවන පාර්ශවයක් වෙත පවතින බැඳීම් වලින් හෝ වෙනත් අවහිරයන්ගෙන් භාණ්ඩ ( විෂය වස්තුව ) නිදහස් විය යුතු බවට **<u>ව්‍යංග ප්‍රතිඥාභාරයක්</u>** ඇත.

උදා - A විසින් B නැමැති බැංකුවෙන් ණය මුදලක් ලබා ගන්නා අතර, A සතු එකම කාර් රථය ඊට සුරක්ෂිතයක් (ඇපයක්) ලෙස තබයි. අදාල ණය ගිවිසුමේ වැඩිදුරටත් සඳහන් වන්නේ A විසින් ණය මුදල නිසි ලෙස ගෙවීම පැහැර හැරියහොත් එම කාර් රථයෙහි සන්තකය බැංකුව වෙත ලබාගෙන එය විකුණා එම ණය මුදල අයකර ගැනීමට බැංකුවට අයිතියක් ඇති බවයි. මෙම ඇපය පිළිබඳව නොදන්වා A විසින් එම කාර් රථය C වෙත විකුණයි නම්,

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

**2. විස්තර කිරීමක් මත භාණ්ඩ විකිණීමකදී යෙදෙන වටහාගත හැකි කරුණු**

වීස්තර කිරීමක් මත විශ්වාසය තබා පාර්ශවකරුවන් භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට ඇතුලත්ව ඇත්නම්, විකුණුම්කරු විසින් සපයන භාණ්ඩය එම විස්තරයට අනුරූප විය යුතුය. **<u>මෙය ව්‍යංග හෙවත් වටහා ගත හැකි කොන්දේසියකි.</u>** භාණ්ඩ නියැදියක් ( සාම්පලයක් ) මගින් සහ විස්තරයක් අනුව විකුණනු ලබන විටදී එම භාණ්ඩ තොගය, නියැදියට සහ විස්තරයට අනුකූල විය යුතුය. ( ව්‍යංග කොන්දේසියකි.)

## <u>Remoore and Landnes</u>

මෙම නඩුවේදී ඒ විසින් බී ගෙන් පළතුරු ටින් 3000 ක් මිලදී ගැනීමට ගිවිසුමකට ඇතුලත් විය. එක් ඇසුරුමක ටින් 30 බැගින් අසුරා සපයන බවට විස්තර කළද, ලබා දුන් භාණ්ඩ තොගයේ කොටසක ඇසුරුමක ටින් 30 බැගින්ද, කොටසක ටින් 24 බැගින්ද අසුරා තිබුණි. මෙම හේතුව මත ඒ විසින් අදාල භාණ්ඩ තොගය ප්‍රතික්ෂේප කරන ලදී. මේ සම්බන්ධයෙන් පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කළේ මෙහිදී ඉහත ව්‍යංග කොන්දේසිය කඩවී ඇති නිසා එලෙස භාණ්ඩ තොගය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඒ ට ඇති බවයි.

### 3. නියැදි ( සිම්පල් ) මගින් භාණ්ඩ විකිණීම

භාණ්ඩ මුලු තොගයම හෝ තොගයෙන් වැඩි ප්‍රමාණයක් ගුණාත්මකභාවය අතින් නියැදියට සමාන විය යුතු බවට **<u>ව්‍යංග කොන්දේසියක්</u>** ඇත.

ගැනුම්කරුට මුලු භාණ්ඩ තොගයම අදාල නියැදිය සමග සැසඳීම සඳහා සාධාරණ අවස්ථාවක් තිබිය යුතු බවට **<u>ව්‍යංග කොන්දේසියක්</u>** ඇත.

භාණ්ඩ විකිණිය නොහැකි තත්වයට පත් කරන දෝෂ වලින් භාණ්ඩ තොගය නිදහස් විය යුතු බවට සහ නියැදිය සාධාරණ පරීක්ෂාවකට ලක් කිරීමේදි හඳුනාගත නොහැකි එබඳු දෝෂ නොමැති විය යුතු බවට **<u>ව්‍යංග කොන්දේසියක්</u>** ඇත.

### 4. වෙළඳ තත්වයේ තිබිය යුතු බවට වූ ව්‍යංග වගන්ති සහ අවශ්‍යතාවයට සුදුසු වීම.

වීකුණුම්කරුගේ නිපුණතාවය සහ විනිශ්චය මත ගැනුම්කරු විශ්වාස තබන අවස්ථාවකදී සහ භාණ්ඩය කුමන අවශ්‍යතාවයක් සඳහා මිලදී ගන්නේද යන්න ගැනුම්කරු විසින් විකුණුම්කරුට දැනුම් දී ඇති අවස්ථාවකදී, විකුණුම්කරුගේ සාමාන්‍ය ව්‍යාපාරික පරිචය තුළ භාණ්ඩය විකුණන්නේ නම්, එම භාණ්ඩය අදාල අපේක්ෂිත පරමාර්ථයට ( අවශ්‍යතාවයට ) සුදුසු විය යුතු බවට **<u>ව්‍යංග කොන්දේසියක්</u>** ඇත. ( සැ.යු.- ගැනුම්කරු විසින් විකුණුම්කරුගේ නිපුණතාවය සහ විනිශ්චය මත විශ්වාසය නොතබන අවස්ථාවකදී මෙම ව්‍යංග කොන්දේසිය අදාල නොවේ. තවද, භාණ්ඩයක් එහි ස්වාධිකාර නාමයෙන් ( පේටන්ට් ) හෝ වෙළඳ නාමයෙන් ( ට්‍රේඩ් මාර්ක් ) නිශ්චිතව දක්වා ඇති විට අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසිය අදාල නොවේ.)

තවද, යම් භාණ්ඩයක් භාවිතා කල හැක්කේ යම් නිශ්චිත අවශ්‍යතාවයක් සඳහා පමණක් නම්, එම භාණ්ඩය ඉල්ලා සිටීමෙන් තමන්ගේ අවශ්‍යතාවය ගැනුම්කරු විසින් විකුණුම්කරු වෙත ව්‍යංගව ප්‍රකාශ කලා සේ සැලකේ. උදා -

කිරි ⇨ බීමට

ආහාර ⇨ කෑමට

ඇඳුම් ⇨ ඇඳීමට

**<u>ඕස්ට්‍රේලියන් නිට්ං මිල්ස් එ. ග්‍රාන්ට්</u>** - මෙහිදී සාප්පුවකින් යට ඇඳුමක් මිලදී ගත් කාන්තාවක් එය පාවිච්චි කළ පසු දරුණු චර්ම රෝගයකට භාජනය වූ අතර පසුව අනාවරණය වූයේ එම ඇඳුම මිනිස් පරිභෝජනය සඳහා නුසුදුසු එකක් බවයි. අධිකරණය මෙහිදී තීරණය කළේ එම භාණ්ඩය අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසිය මෙහිදී කඩවී ඇති බැවින් වන්දි ලබාගත හැකි බවයි.

භාණ්ඩ විකුණන විකුණුම්කරුවකුගේ විස්තරයකට අනුව භාණ්ඩ මිලදී ගන්නා විට එම භාණ්ඩ වෙළඳ තත්වයේ තිබිය යුතු බවට ( වාණිජමය යෝග්‍යතාවයේ තිබිය යුතු බවට ) **<u>ව්‍යංග කොන්දේසියක්</u>** ඇත.

**<u>ප්‍රිස්ට් එ. ලාස්ට්</u>** - මෙහිදී උණුවතුර බෝතලයක් මිලදී ගත් අයෙක විසින් ඊට උණුවතුර පිරවූ විට එම බෝතලය පුපුරා ගියේය. අදාල භාණ්ඩය වෙළඳ තත්වයේ නොමැති බව ( එනම් ඉහත ව්‍යංග කොන්දේසිය කඩවී ඇති බව ) අධිකරණය තීරණය කළේය.

කෙසේ නමුත්, ගැනුම්කරු විසින් පරීක්ෂා කොට භාණ්ඩ මිලදී ගන්නා විට එම පරීක්ෂාවේදී අනාවරනය විය යුතු දෝෂ හෙවත් අඩුපාඩු සම්බන්ධයෙන් මෙම ව්‍යංග කොන්දේසිය අදාල නොවේ.

තවද, භාණ්ඩයක් එහි ස්වාධිකාර නාමයෙන් ( පේටන්ට් ) හෝ වෙලඳ නාමයෙන් ( ට්‍රේඩ් මාර්ක් ) මගින් නිශ්චිතව දක්වා ඇති විට අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසිය අදාල නොවේ.

## " <u>ගැනුම්කරු ප්‍රවේශම් විය යුතුය " සිද්ධාන්තය (CAVEAT EMPTOR ) / ( BUYER BE AWARE )</u>

ගැනුම්කරු විසින් භාණ්ඩ මිලදී ගන්නා විට ඒවා දෝෂ සහිත නම් එවිට ඇති වන පාඩුව ගැනුම්කරු විසින් දරා ගත යුතුය. එනිසා භාණ්ඩ මිලදී ගැනීමට පෙර හොඳින් පරීක්ෂා කර බලා භාණ්ඩයේ ගුණාත්මකභාවය සහ තත්වය තහවුරු කෙරෙන ප්‍රකාශිත නියමයන් එකී ගිවිසුමට ඇතුලත් වන බවට ගැනුම්කරු සැලකිලිමත් වීම වටී.

## <u>භාණ්ඩයේ අයිතිකරුවෙකු නොවන අයෙකු විසින් සිදු කරනු ලබන භාණ්ඩ විකිණීමක් වලංගු වන අවස්ථා</u>

1. ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන්

2. වණික් - යෝජිතයා මගින් විකිණීම  වණික් - යෝජිතයා නැමැති තැනැත්තෙකු විසින් ගැනුම්කරුවෙකු වෙත භාණ්ඩ විකිනීමක් සිදු කල විට ගැනුම්කරු හට යහපත් හිමිකමක් ලැබේ.

3. විකිණීම සඳහා විශේෂ බලයක් සහිතව සිදු කරන භාණ්ඩ විකිණීමකදී

4. ලියමේ අයිතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු හෝ සන්තරණයේදී නැවැත්වූ පසු නැවත විකිණීමකදී

5. **<u>පිලිප්ස් එරෙහිව බෲක්ස්</u>** නඩු තීන්දුවේ පරිදි අවස්ථාවකදී

## භාණ්ඩ වර්ගීකරණය

අධ්‍යයනයේ පහසුව තකා භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වූ "භාණ්ඩ" පහත පරිදි වර්ග කෙරේ.

## නිශ්චිත භාණ්ඩ / නියමිත භාණ්ඩ / නිරූපිත භාණ්ඩ

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වූ භාණ්ඩය හඳුනාගෙන එකී ගිවිසුම වෙනුවෙන්ම වෙන් කර ඇත්නම්. එය නිශ්චිත භාණ්ඩයකි / නියමිත භාණ්ඩයකි.

උදාහරණ - WP NC - 2365 අංක දරණ බස් රථය විකිණීමට සහ මිලදී ගැනීමට පාර්ශවයන් දෙකක් ගිවිසුමකට ඇතුලත් වේ. ගිවිසුමට ඇතුලත් වන මොහොතේදී ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩය, එහි පාර්ශවකරුවන් විසින් හඳුනා ගෙන දැනටමත් ගිවිසුම වෙනුවෙන් වෙන්කර ඇති බැවින් එය නිශ්චිත භාණ්ඩයකි / නියමිත භාණ්ඩයකි.

## අවිනිශ්චිත භාණ්ඩ / ( නිශ්චිත නොවන භාණ්ඩ ) / අනිර්ණිත භාණ්ඩ

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වූ භාණ්ඩය හඳුනාගෙන එකී ගිවිසුම වෙනුවෙන්ම වෙන් කර නොමැති නම්. එය අවිනිශ්චිත භාණ්ඩයකි / නිශ්චිත නොවන භාණ්ඩයකි.

උදාහරණ – A නැමැති තොග වශයෙන් සහල් විකුණන විකුණුම්කරුගෙන් සහල් මිටි 10 ක් මිලදී ගැනීමට B , A සමග ගිවිසුමකට එලඹේ. නමුත් එලෙස ගිවිසුමට එලඹෙන මොහොත වන විට විකුණුම්කරු සතුව සහල් මිටි 1000 ක් ඇතැයි සිතන්න. එම සහල් මිටි දහසෙන් කුමන සහල් මිටි දහය ගැනුම්කරු වෙත ලබා දෙන්නේද යන්න පිලිබඳව ගිවිසුමට එලඹෙන මොහොතේදී නිශ්චය කොට නොමැති නිසා ( හඳුනාගෙන නොමැති නිසා ) මෙම භාණ්ඩය අවිනිශ්චිත භාණ්ඩයක් වේ.

සැ.යු.- එම සහල් තොගයෙන් සහල් මිටි 10 ක් එම භාණ්ඩ විකිණීමේ ගිවිසුම සඳහා වෙන් කල පසු එය නිශ්චිත / නියමිත භාණ්ඩයක් බවට පත්වේ.

## පවතින භාණ්ඩ

භාණ්ඩ විකිණීමේ ගිවිසුමට ඇතුලත්වන අවස්ථාවේදී ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩයේ අයිතිය සහ භුක්තිය විකුණුම්කරු භාරයේ පවතී නම් එය පවතින භාණ්ඩයකි.

## අනාගත භාණ්ඩ

භාණ්ඩ විකිණීමේ ගිවිසුමට ඇතුලත්වන අවස්ථාවේදී ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩයේ අයිතිය සහ භුක්තිය විකුණුම්කරු භාරයේ නොමැති නම් එය අනාගත භාණ්ඩයකි.

උදාහරණ – සහල් වෙලෙන්දෙකු වන A වෙතින් සහල් මිටි 10 ක් , එකක් රුපියල් පන්දහස බැගින් මිලදී ගැනීමට B , A සමග ගිවිසුමකට එලඹුනේ යැයි සිතන්න. නමුත් මෙම ගිවිසුමට එම

දෙපාර්ශවය විසින් එලඹෙන අවස්ථාවේදී විකුණුම්කරු සතුව සහල් මිටි 10 ක් නොමැත. එවිට එම භාණ්ඩය , අනාගත භාණ්ඩයකි.

මෙවන් ගිවිසුමක් භාණ්ඩ විකිණීමට එකඟ වීමේ ගිවිසුමකි. මෙහිදී අදාල විකුණුම්කරු විසින් B සමග තමා එලඹි භාණ්ඩ විකිණීමේ ගිවිසුම ඉෂ්ට කිරීමට සහ තම වෙනත් ඉදිරි ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් සහල් මිටි දහසක් තම වෙලඳ සැල වෙත ආනයනය කලේ යැයි සිතන්න. එවිට මෙම භාණ්ඩ විකිණීමේ ගිවිසුමට විෂය වස්තුව වන භාණ්ඩය වන සහල් මිටි දහය අනාගත භාණ්ඩයක තත්වයේ සිට පවතින භාණ්ඩයක තත්වයට එනම් පවතින භාණ්ඩයක් බවට පත්වේ. තවදුරටත් , එම සහල් මිටි 10, එම භාණ්ඩ විකිණීමේ ගිවිසුම වෙනුවෙන් නිශ්චිතවම වෙන් කර නොමැත් නිසා එය අවිනිශ්චිත භාණ්ඩයකි. එම සහල් මිටි 1000 ක තොගයෙන් ඉහත සඳහන් භාණ්ඩ විකිණීමේ ගිවිසුමට අදාල සහල් මිටි 10 වෙන් කල විගස එය නිශ්චිත භාණ්ඩයක් බවට පත්වේ.

පහත ගැලීම් සටහන බලන්න.


**අනාගත භාණ්ඩ ⇉ පවතින භාණ්ඩ ⇉ ( අවිනිශ්චිත භාණ්ඩ ) ⇉ නිශ්චිත භාණ්ඩ**

**<u>භාරදිය හැකි තත්වයේ පවතින භාණ්ඩ</u>**

ගැනුම්කරු සහ විකුණුම්කරු අතර භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති වන මොහොතේදී විෂය වස්තුව වන භාණ්ඩය, පවත්නා ස්වරූපයෙන්ම ගැනුම්කරු වෙත ලබා දිය හැකි නම් එය භාරදිය හැකි තත්වයේ පවතින භාණ්ඩයකි.

**<u>භාරදිය නොහැකි තත්වයේ පවතින භාණ්ඩ</u>**

ගැනුම්කරු සහ විකුණුම්කරු අතර භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති වන මොහොතේදී විෂය වස්තුව වන භාණ්ඩය, පවත්නා ස්වරූපයෙන්ම ගැනුම්කරු වෙත ලබා දිය නොහැකි නම් ( එනම්, එය ගැනුම්කරු වෙත ලබා දීම සඳහා විකුණුම්කරු විසින් එකී භාණ්ඩයට යමක් කල යුතු වේ නම් ) එය භාරදිය හැකි තත්වයේ පවතින භාණ්ඩයකි.



□□ භාණ්ඩ විකිණීමේ ගිවිසුමට එලඹෙන අවස්ථාවේදී විකුණුම්කරුගේ දැනීමෙන් තොරව නිශ්චිත භාණ්ඩ විනාශ වී ඇත්නම් එවිට එම ගිවිසුම හිස් ( ශූන්‍ය ) ගිවිසුමක් බවට පත්වේ. □□

✠✠ විකුණුම්කරුගේ හෝ ගැනුම්කරුගේ දෝෂයකින් තොරව, ගැනුම්කරු වෙත අවධානම මාරු වීමට පෙර, අදාල භාණ්ඩ විකිණීමේ ගිවිසුමට විෂය වස්තුව වූ භාණ්ඩය විනාශ වී ඇත්නම් එම විකිණීමට එකඟ වීමේ ගිවිසුම අවලංගු කල හැකිය. ✠✠

## භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වන භාණ්ඩ වල අයිතිය ( හිමිකම ) ගැනුම්කරුට පැවරෙන මොහොත

භාණ්ඩ විකිණීමේ ගිවිසුමට විෂය වස්තුව වූ භාණ්ඩ වලට යම් අලාභයක් සිදු වුවහොත් එම අලාභය දරා ගත යුත්තේ විකුණුම්කරු විසින්ද ? එසේත් නැතිනම් ගැනුම්කරු විසින්ද යන්න තීරණය කිරීම සඳහා විකුණුම්කරුගෙන් ගැනුම්කරු වෙත එම භාණ්ඩ වල අයිතිය හුවමාරු වන අවස්ථාව වැදගත් සාධකයකි.

## අයිතිය සමග වගකීම පැවරීම

අදාල භාණ්ඩ විකිණීමේ ගිවිසුම තුල පාර්ශවයන් වෙනත් ලෙසකට ගිවිසගෙන නොමැති නම්,

- ගැනුම්කරුට භාණ්ඩවල අයිතිය මාරු වන තුරු භාණ්ඩ පිලිබඳ වගකීම විකුණුම්කරු වෙත පවතී.
- භාණ්ඩ භාර දීම සිදු කලත්, නැතත් භාණ්ඩයේ අයිතිය ගැනුම්කරු වෙත පැවරූ පසු භාණ්ඩ, ගැනුම්කරුගේ වගකීම යටතේ පවතින අතර භාණ්ඩ බාර දීම ප්‍රමාද වන්නේ යම් පාර්ශවයක වරදින්, අතපසුවීමකින් නම් වගකීම එම පාර්ශවය වෙත පවතී.

භාණ්ඩ විකිණීමේ ගිවිසුමට අදාල විෂය වස්තුවෙහි හිමිකම විකුණුම්කරුගෙන් ගැනුම්කරු වෙත පැවරෙන මොහොත තීරණය කිරීම සඳහා දෙපාර්ශවයේ එකඟතාවය මත යොදා ගත හැකි කොන්දේසි පහත පරිදි වේ.

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

භාණ්ඩ විකිණීමේ ආඥා පනත ප්‍රකාරව අදාල විෂය වස්තුවෙහි හිමිකම විකුණුම්කරුගෙන් ගැනුම්කරු වෙත පැවරෙන මොහොත තීරණය කිරීම සඳහා අදාල වන **<u>රීතීන් 05 ක්</u>** ඇත. **<u>මෙම රීතීන් හිමිකම පැවරීම සම්බන්ධයෙන් කොන්දේසි විරහිත ගිවිසුම් වලට අදාල වේ.</u>**

## <u>01 රීතිය</u>

භාරදිය හැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ ( නියමිත භාණ්ඩ ) විකිණීම සඳහා ඇතුලත්වූ **<u>කොන්දේසි විරහිත ගිවිසුමක,</u>** එම භාණ්ඩ වල අයිතිය, පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුලත්වන ( එලඹෙන ) මොහොතේදීම ගැනුම්කරුට පැවරේ.

**<u>TRAILING Vs BAXTER</u>** - මෙම නඩුවේදී විකුණුම්කරු සතු කමතේ ගොඩගසා තිබූ පිදුරු තොගයක් විකිණීම සඳහා ගැනුම්කරු සමග ගිවිසුමකට එලඹෙන ලදී. මිලදී ගන්නා ලද පිදුරු තොගය ඉවත් කර ගන්නා තෙක් කමතේ තබා තිබීමට ඉඩදී තිබුණි. මේ අතර හදිසියේම ඇතිවූ ගින්නකින් එම පිදුරු තොගය සම්පූර්ණයෙන්ම විනාශ විය. අධිකරණය මෙහිදී තීරණය කලේ පිදුරු තොගය විනාශ වීම සම්බන්ධයෙන් වන පාඩුව ............................. විසින් දරා ගත යුතු බවය.

## <u>02 රීතිය</u>

භාරදිය නොහැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ ( නියමිත භාණ්ඩ ) විකිණීම සඳහා ඇතුලත්වූ කොන්දේසි විරහිත ගිවිසුමක, එම භාණ්ඩ වල අයිතිය ගැනුම්කරුට පැවරෙන්නේ

( I ) විකුණුම්කරු විසින් අදාල ක්‍රියාව සිදු කර භාණ්ඩ භාරදිය හැකි තත්වයට පත් කිරීමෙන් පසුව සහ

( II ) භාණ්ඩ භාර දිය හැකි තත්වයට පත් කර ඇති බව ගැනුම්කරුට දැනගැනීමට ලැබෙන මොහොතේදීය.

**<u>Underwood Vs Brough Castle</u>** - මෙම නඩුවේදී පොලවට සම්බන්ධ කොට නිපදවා තිබූ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා පාර්ශවයන් දෙකක් ගිවිසුමකට එලඹුනහ. එම ගිවිසුමට අනුව එම යන්ත්‍රය නිපදවා අවසන් වීමෙන් පසුව එය දුම්රිය මගින් ගැනුම්කරු වෙත යැවීමට නියමිතව තිබුණි. මෙය ගැනුම්කරු වෙත යැවීම සඳහා දුම්රියට පටවන අවස්ථාවේදී ඊට හානි සිදුවිය. එලෙස හානි සිදුවන අවස්ථාවේදී එම යන්ත්‍රය භාරදිය හැකි තත්වයට පත්කර තිබූ බව ගැනුම්කරුදැනගෙන නොසිටියේය.

අධිකරණය මෙහිදී තීරණය කලේ මෙම ගිවිසුමට පාර්ශවකරුවන් ඇතුලත් වන මොහොතේදී භාරදිය නොහැකි මට්ටමේ නිශ්චිත භාණ්ඩයක් වන බැවින් ඉහත දෙවන රීතිය යෙදිය යුතු බවත් ඒ අනුව අදාල යන්ත්‍රයට සිදුවූ පාඩුව ............................................ විසින් දරා ගත යුතු බවත්ය.

**Phillip Head Vs Show Fronts** - ගැනුම්කරුවෙකු වෙත බුමුතුරුණු රෝලක් සපයා එය ගැනුම්කරුගේ නිවසේ එලා භාර දීමට විකුණුම්කරු ගිවිසුමකට ඇතුලත් විය. ඒ අනුව විකුණුම්කරු බුමුතුරුණු රෝලක්, හොඳින් ඔතන ලද ශක්තිමත් මිටියක් ලෙස ගෙනැවිත් එලෙසම ගැනුම්කරුගේ නිවසේ තබා එය අතුරා දීමට පසුදින පැමිණෙන බව දන්වමින් පිටව ගියේය.

එදින රාත්‍රියේ බුමුතුරුණු රෝල ගැනුම්කරුගේ වරදකින් තොරව සොරුන් විසින් සොරා ගෙන ගොස් තිබූ නිසා තමාට සිදුවූ පාඩුව අයකර ගැනීම සඳහා පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ මෙම ගිවිසුමට පාර්ශවකරුවන් ඇතුලත් වන මොහොතේදී භාරදිය නොහැකි මට්ටමේ නිශ්චිත භාණ්ඩයක් වන බැවින් ඉහත දෙවන රීතිය යෙදිය යුතු බවත් ඒ අනුව අදාල සිදුවූ පාඩුව ........................................... විසින් දරා ගත යුතු බවත්ය.

## 03 රීතිය

භාරදිය හැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ ( නියමිත භාණ්ඩ ) විකිණීම සඳහා ඇතුලත්වූ කොන්දේසි විරහිත ගිවිසුමක, එම භාණ්ඩ වල මිල නියම කිරීම සඳහා විකුණුම්කරු විසින් යම් ක්‍රියාවක් සිදු කල යුතු වන්නේ නම් ( උදා - කිරීම, මැනීම, වෙනත් පරීක්ෂණයකට යටත් කිරීම ) එවිට එම භාණ්ඩ වල අයිතිය ගැනුම්කරුට පැවරෙන්නේ,

( a ) විකුණුම්කරු විසින් අදාල ක්‍රියාව සිදුකර භාණ්ඩ වල මිල නියම කිරීමෙන් පසුව සහ

( b ) ඒ බවට ගැනුම්කරුට දැනගන්නට ලැබුණ මොහොතේදීය.

◈◈ නමුත් මෙහිදී මිල නියම කිරීම සඳහා අදාල ක්‍රියාව ( කිරීම, මැනීම වැනි ) සිදු කල යුතු වන්නේ ගැනුම්කරු විසින් නම්, මෙම රීතිය අදාල නොවේ. ◈◈

**Turley Vs Bates** - එක්තරා පස් වර්ගයක් හොන්ඩරයක් පවුම් X බැගින් A විසින් B ට විකිණීමටත්, එම පස් ලොරියට පටවන විට B විසින් කිරා පැටවීමටත් ඒ අනුව මිල ගෙවීමටත් එකඟ විය. පස් කිරා පැටවීමට පෙර අධික වර්ෂාව හේතුවෙන් එම පස් තොගය දිය වී ගිය අතර එහිදී සිදුවූ අලාභය ගැනුම්කරු දරා ගත යුතු බව අධිකරණය තීරණය කලේය.

## 04 රීතිය

භාණ්ඩ යවා ඇත්තේ විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත නම් එම භාණ්ඩ වල අයිතිය ගැනුම්කරු වෙත පැවරෙන්නේ

( a ) ගැනුම්කරු විසින් ප්‍රකාශිතව හෝ ව්‍යංගව භාණ්ඩ අනුමත කරන බව විකුණුම්කරුට දැනුම් දුන් විට ( උදා - ගැනුම්කරුට යැවූ භාණ්ඩ ගැනුම්කරු විසින් නැවත විකුණයි නම් හෝ උකස් කරයි නම් නම් එමගින් පැහැදිලි වන්නේ එම භාණ්ඩ විකුණුම්කරු වෙතින් මිලදී ගැනීම ව්‍යංගව සිදු කර ඇති බවයි. ) හෝ

( b ) අදා භාණ්ඩ අනුමත නොකරයි නම් ( එනම්, ගැනුම්කරු විසින් එම භාණ්ඩ මිලදී නොගන්නේ නම් ) ඒවා ආපසු එවිය යුතු කාලය දක්වා ඇති විටකදී එම කාල සීමාවෙන් පසුවත් ගැනුම්කරු විසින් එම භාණ්ඩ තමා භාරයේ තබා ගනී නම්, එකී ආපසු එවීමේ කාලසීමාව ඉකුත් වීමත් සමගම එම භාණ්ඩ වල අයිතිය ගැනුම්කරු වෙත පැවරේ.

( c ) භාණ්ඩ ආපසු එවීමේ කාලසීමාව සඳහන් කර නොමැති විටකදී සාධාරණ කාලයක් ඉකුත් වීමෙන් පසුව එම භාණ්ඩ වල අයිතිය ගැනුම්කරු වෙත පැවරේ. ( එනම්, අදාල විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගැනුම්කරු වෙත ලද භාණ්ඩ, ඔහු විසින් සාධාරණ කාලයක් ඉකුත් වීමෙන් පසුවත් තමා භාරයේ තබා ගෙන ඇත් නම් එහි අර්ථය වන්නේ ඔහු එම භාණ්ඩ මිලදී ගෙන ඇති බවට නීතිය විසින් පිලිගනු ලැබීමයි. )

**Poole Vs Smith Car Sales** – විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත ගැනුම්කරුවෙකු වෙත යැවූ මෝටර් රථයක් මාස තුනක් ගැනුම්කරු භාරයේ තබා ගන්නා ලදී. පසුව ගැනුම්කරු විසින් එය නොවැම්බර් 10 දිනට පෙර එම රථය විකුණුම්කරු වෙත ආපසු එව්වේ නැතිනම් එය ගැනුම්කරු විසින් මිලදී ගත්තා සේ තමන් සලකන බව විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත ලිපියකින් දන්වා සිටියේය. ගැනුම්කරු එම රථය විකුණුම්කරු වෙත ආපසු යැව්වේ නොවැම්බර් මස අගදීය. ඒ වන විට මෝටර් රථයට තරමක් හානි සිදුවී තිබුණි.

අධිකරණය මෙහිදී තීරණය කලේ මෙය විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත වන ගිවිසුමක් වන බැවින් මෙහිදී ඉහත 4 වන රීතිය යෙදිය යුතු බවත් ඒ අනුව අදාල සිදුවූ පාඩුව ............................................ විසින් දරා ගත යුතු බවත්ය.

**කර්හැම් එරෙහිව ඇටන්බරෝ** - K විසින් විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ස්වර්ණාභරණ තොගයක් W ට යැවූ අතර,පසුව W විසින් එය A ට උකස් කරයි. අධිකරණය මෙහිදී තීරණය කලේ එම ස්වර්ණාභරණ වල අයිතිය W ට පැවරී ඇති බවත්, ඒ අනුව එම ස්වර්ණාභරණ A වෙතින් ආපසු ලබා ගැනීමේ අයිතියක් K ට නොමැති බවයි. ( ඒ අනුව K ට ඇත්තේ එම ස්වර්ණාභරණ වල මිල W වෙතින් ආපසු අයකර ගැනීමේ අයිතිය යි. )

## නිශ්චය නොකල භාණ්ඩ වල අයිතිය පැවරීම

### 05 රීතිය

විස්තර කිරීමක් මත අවිනිශ්චිත භාණ්ඩ විකිණීම සඳහා ඇතුලත් වූ කොන්දේසි විරහිත ගිවිසුමකදී එම විස්තරයට අනුරූප වන භාණ්ඩ විකුණුම්කරුගේ ප්‍රකාශිත හෝ ව්‍යංග එකඟතාවය මත එම ගිවිසුම වෙනුවෙන් කොන්දේසි විරහිතව වෙන් කරයි නම්, එම මොහොතේදී එම භාණ්ඩ වල අයිතිය ගැනුම්කරු වෙත පැවරේ.

**පිග්නටාරෝ එරෙහිව ගිල්රෝයි** - විස්තර කල වර්ගයේ සහල් මිටි 140 ක් විකිණීම සඳහා දෙපාර්ශවයක් ගිවිසුමකට එලඹුණහ.එසේ ගිවිසුමට ඇතුලත්ව දින දෙකකට පසුව විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත ලිපියක් යවමින් දන්වා සිටියේ විස්තර කල වර්ගයේ සහල් , ගිවිසුම වෙනුවෙන් වෙන් කල බවත් ඉන් කොටසක් ( මිටි 15 ක් ) තම ව්‍යාපාරික ස්ථානයෙන්ද, ඉතිරිය ( මිටි 125 ) තම ගබඩාවෙන්ද ලබා ගත හැකි බවයි. ලිපිය ලැබී මාසයකට පමණ පසුව ගැනුම්කරු විසින් විකුණුම්කරුගේ ව්‍යාපාරික ස්ථානය වෙත එම සහල් ප්‍රමාණය ලබා ගැනීම සඳහා ගිය විට ( මින් පැහැදිලි වන්නේ විකුණුම්කරුගේ වෙන් කිරීම ගැනුම්කරු විසින් ව්‍යංගයෙන් අනුමත කර ඇති බවයි ) ගැනුම්කරුට දැන ගත හැකි වූයේ පෙරදින රාත්‍රියේදී එහි වූ සහල් මිටි විකුණුම්කරුගේ වරදකින් තොරව සොරුන් විසින් සොරකම් කර ඇති බවයි.

අධිකරණය මෙහිදී තීරණය කලේ මෙය අවිනිශ්චිත භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් වන කොන්දේසි විරහිත ගිවිසුමක් වන බැවින් ඉහත 5 වන රීතිය මෙහිදි යෙදිය යුතු වන බවත් ඒ අනුව අදාල සිදුවූ පාඩුව ............................................ විසින් දරා ගත යුතු බවත්ය.

## අයිතිකරුවෙකු නොවන අයෙකු විසින් භාණ්ඩ විකිණීම

සාමාන්‍ය රීතිය අනුව ගැනුම්කරුට හිමිවන්නේ එම භාණ්ඩය විකුණන අවස්ථාවේදී එම භාණ්ඩය සම්බන්ධයෙන් විකුණුම්කරුට තිබූ අයිතියට සමාන අයිතියකි. භාණ්ඩයේ අයිතිකරුවෙකු නොවන පුද්ගලයෙකු අයිතිකරුගේ කැමැත්ත හෝ අවසරය නොමැතිව ගැනුම්කරුවෙකු වෙත භාණ්ඩ විකුණා ඇති විට ගැනුම්කරුට හිමිවන්නේ එකී භාණ්ඩය විකුණන මොහොතේ එහි විකුණුම්කරුට තිබූ අයිතියට සමාන අයිතියකි. ( එනම්, ශූන්‍ය අයිතියකි. )

එහෙත් භාණ්ඩයේ හිමිකරු තමන්ගේ හැසිරීමෙන් ( ව්‍යංගයෙන් ) එම භාණ්ඩය විකිණීම සඳහා තමාගේ කැමැත්ත හෝ අවසරය වෙනත් අයෙකුට ලබා දී ඇති බවට හඟවා ඇත්නම්, එවිට ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන් අයිතිකරුට තිබූ අයිතියට සමාන අයිතියක් ගැනුම්කරුටද ලැබේ.

පහත උදාහරණය සලකන්න.

B විසින් A ගේ ජෙනරේටරය සොරාගෙන C ට විකුණයි නම්,

..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

**ග්‍රීන්වුඩ් එරෙහිව බෙනට්** - B තම කාර් රථය අලුත්වැඩියා කිරීම සඳහා S ට භාරදෙයි. S , එය අලුත්වැඩියා කිරීම පසෙක ලා එය තම පෞද්ගලික පාවිච්චියට යොදා ගත් අතර පසුව එය හදිසි අනතුරකට ලක්විය. ඊට පසුව S විසින් එම වාහනය එම තත්වයෙන්ම නිර්දෝෂී ගැනුම්කරුවෙකු වන H ට විකුණයි. H විසින් එම රථය හොඳින් අලුත්වැඩියා කොට මූල්‍ය සමාගමකට විකුණයි.

අධිකරණය මෙහිදී තීරණය කලේ එම රථයේ මුල් අයිතිකරු වන B ට එකී රථය ආපසු අත්පත් කර ගැනීමට හැකි අතර, එය අලුත්වැඩියා කිරීමට H ට වැයවූ මුදල B විසින් H ට ආපසු ගෙවිය යුතු බවයි. ( පහත සටහන බලන්න.)

……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………

## **වෙන්දේසියේ විකිණීම**

භාණ්ඩ කොටස් ( Lot ) වශයෙන් වෙන්දේසියට දමා ඇති විට, ඒ එක් එක් කොටස වෙන වෙනම විකුණුම් ගිවිසුමකට විෂය වස්තුව වේ. මිටිය පහත දැමීමෙන් හෝ වෙනත් සාම්ප්‍රදායික ක්‍රමයකට වෙන්දේසිකරු විසින් වෙන්දේසිය අවසන් බව ප්‍රකාශ කිරීමත් සමග වෙන්දේසිය මගින් විකිණීම සම්පූර්ණ වේ. වෙන්දේසිකරු එම ප්‍රකාශනය කරන තෙක්ම ලංසුකරුට තම ලංසුව ඉල්ලා අස් කර ගත හැකිය.

තවද, භාණ්ඩ වෙන්දේසියකදී අදාල භාණ්ඩ වල හිමිකරුටද එම වෙන්දේසියේදී ලංසු තැබීම සඳහා ඉදිරිපත් විය හැකිය. ලංසු තැබීමට තමන්ටද අයිතියක් ඇති බව විකුණුම්කරු විසින් වෙන්දේසිය ආරම්භයට ප්‍රථමයෙන් දන්වා නැත්නම්, තමන්ගේම භාණ්ඩ වලට ලංසු තැබීමට භාණ්ඩවල අයිතිකරුට හැකියාවක් නොමැත.

තවද, භාණ්ඩය අවම විකුණුම් මිලකට යටත් කිරීමට මෙන්ම එයට අවම මූලික ලංසුවක් නියම කිරීමටද විකුණුම්කරුට හැකියාව ඇත.

**ඩෙනන්ට් එ. ස්කිනර්** - භාණ්ඩ වෙන්දේසියකදී කාර් රථයක් විකුණූ පසුව එම දෙපාර්ශවය විසින්, ඒ සඳහා ලබා දුන් චෙක්පත නිශ්කාශනය වන තෙක් එහි අයිතිය ගැනුම්කරු වෙත නොපැවරෙන බවට කොන්දේසියකට එකඟ වුණි. එකී චෙක්පත අගරු වූ නමුත් අධිකරණය මෙහිදී තීරණය කළේ එම ගිවිසුමට එළඹෙන මොහොත වන විට අදාල වෙන්දේසියේ භාණ්ඩ විකිණීම සම්පූර්ණව ඇති නිසා එහි හිමිකම ගැනුම්කරු වෙත දැනටමත් මාරු වී ඇති බැවින් ඉන් පසුව එකඟ වූ කොන්දේසිය ( එනම්, චෙක්පත නිශ්කාශනය වන තෙක් එහි අයිතිය ගැනුම්කරු වෙත නොපැවරෙන බවට වූ කොන්දේසිය ) , කාර් රථයේ හිමිකම මාරු වීමට බලපෑමක් නොවන බවයි.

## <u>භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඉටු කිරීම</u>

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 27 වන වගන්තියට අනුව,

☺☺ අදාල භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ වගන්ති ප්‍රකාරව භාණ්ඩ භාර දීම විකුණුම්කරුගේ වගකීම

වන අතර ,

☺☺ එම භාණ්ඩ භාරගෙන ගිවිසුමේ ප්‍රකාරව ඒ සඳහා ගෙවීම් සිදුකිරීම ගැනුම්කරුගේ වගකීම වේ.

☒☒ මෙහි භාණ්ඩ භාරදීම යන්නෙන් අදහස් වන්නේ එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට ස්වේච්ඡාවෙන් භාණ්ඩ වල සන්තකය පැවරීමයි. ☒☒

## <u>භාණ්ඩ කොටස් වශයෙන් භාරදීම</u>

වෙනත් ආකාරයකට පාර්ශවකරුවන් එකඟව ඇතොත් මිස, භාණ්ඩ කොටස් වශයෙන් භාර ගැනීමට ගැනුම්කරු බැඳී නැත. එහෙත් කොටස් වශයෙන් භාර ගෙන ඒ එක් එක් කොටසක් සඳහා වෙන් වෙන් වශයෙන් ගෙවීම් කල යුතු බවට ප්‍රතිපාදනයන් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක තිබිය හැකිය.

භාණ්ඩ කොටස් වශයෙන් භාරදෙන එවන් ගිවිසුමකදී විකුණුම්කරු විසින් හෝ ගැනුම්කරු විසින් එම ගිවිසුම උල්ලංගනය කලහොත් එම උල්ලංගනය කිරීම,

- ••• සමස්ත ගිවිසුමෙන් කොපමණ ප්‍රමාණයක කොටසක් උල්ලංගනය කර ඇත්ද ?
- ••• නැවත එවන් උල්ලංගනයක් සිදුවීමේ සම්භාවිතාව කොපමණද ?

යන කරුණු අනුව සමස්ත ගිවිසුමම උල්ලංගනය කිරීමක්ද ? නැතහොත් සමස්ත ගිවිසුම උල්ලංගනය නොකල සේ සැලකිය හැකිද ? යන්න තීරණය වේ.

**<u>රොබට් ඒ මුන්රෝ සමාගම එ. මේයර්</u>** - සත්ව ආහාර තොගයක් ඒ විසින් බී වෙත විකිණීමට ගිවිසුමකට එළඹි අතර එය මාසයකට ටොන් 125 බැගින් ටොන් 1500 ක් වන තෙක් නැව් මගින් යැවිය යුතු වූ අතර, ඒවා නිශ්චිත ගුණාත්මකභාවයෙන් තොර වුවහොත් එම ආහාර ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බී සතුවිය. මේ අතර එකඟවූ භාණ්ඩ ප්‍රමාණයෙන් අඩක් සපයා, ඒ සඳහා ගෙවීම්ද සිදුකළ පසුව එම ආහාර නිශ්චිත ගුණාත්මකභාවයෙන් තොර බවට අනාවරණය වූ අතර අධිකරණය මෙහිදී තීරණය කළේ ගිවිසුමට අනුකුල නොවන භාණ්ඩ තවදුරටත් භාර ගැනීමේ අවධානම දැරීමට බී බැඳී නොමැති හෙයින් ඉදිරියේදී ඔහු වෙත සැපයීමට නියමිත ආහාර තොගය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බී ට ඇති බවයි.

## භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් කඩකිරීමකදී ගතහැකි සහන

### ගැනුම්කරුට, විකුණුම්කරුට එරෙහිව ගත හැකි සහන

☞ විකුණුම්කරු භාණ්ඩ භාර දීමට අසමත්ව ඇති විට ඒ මත සිදුවූ අලාභ අයකිරීමට නඩු පැවරිය හැකිය.

☞ එලෙසම ඉටුකරන ලෙස ( නිරූපිත ඉටුකිරීම / එපරිදිම ඉටුකිරීම ) නියෝග කරන ඉල්ලා නඩු පැවරීම.

☞ භාණ්ඩ වල මිල දැනටමත් ගෙවා ඇත්නම් විකුණුම්කරු භාණ්ඩ භාරදී නොමැති විටක ගෙවූ මිල ආපසු අයකර ගැනීමට නඩු පැවරීම.

☞ විකුණුම්කරුට අයිති නැති දෙයක් විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත විකිණීම හේතුවෙන් ගැනුම්කරුට එය නියම අයිතිකරුට භාරදීමට සිදු වුවහොත් , එම භාණ්ඩයේ මිල විකුණුම්කරු වෙතින් අයකර ගැනීම සඳහා නඩු පැවරීම.

☞ මීට අමතරව, විකුණුම්කරු විසින් එම භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ කොන්දෙසියක් කඩ කර ඇත්නම්, සහ / හෝ, ප්‍රතිඥාභාරයක් කඩ කර ඇත්නම් අදාල පරිදි ගිවිසුම් නීතියට අනුව අදාල සහන ලබා ගැනීමට අයිතියක් ඇත.

### විකුණුම්කරුට, ගැනුම්කරුට එරෙහිව ගත හැකි සහන

☞ භාණ්ඩ වල අයිතිය ගැනුම්කරු වෙත මාරුවී ඇති විටක, අදාල ගිවිසුමෙහි සඳහන් වූ පරිදි මිල ගෙවා නැත්නම්, භාණ්ඩ වල එම වටිනාකම අයකර ගැනීම සඳහා නඩු පැවරීම.

☞ භාණ්ඩ භාර ගැනීම ගැනුම්කරු ප්‍රතික්ෂේප කරන විට, භාණ්ඩ භාර නොගැනීමෙන් විකුණුම්කරු වෙත සිදුවූ අලාභ අය කර ගැනීම සඳහා නඩු පැවරීම.

### මිල නොලත් විකුණුම්කරුවෙකුගේ අයිතිවාසිකම්

මිල නොලත් විකුණුම්කරුවෙකු යනු භාණ්ඩ විකිණීමේ ගිවිසුම ප්‍රකාරව භාණ්ඩයේ හෝ භාණ්ඩ තොගයේ මිල නියමිත පරිදි / නියමිත අවස්ථාවේදි නොලද විකුණුම්කරුවෙකි.

**භාණ්ඩයේ අයිතිය ගැනුම්කරුට මාරුවී ඇති විට මිල නොලත් විකුණුම්කරුට ,අදාල භාණ්ඩ වලට එරෙහිව පහත අයිතිවාසිකම් ඇත.**

## 1) ලියමේ අයිතිය

විකුණා ඇති භාණ්ඩ වල අයිතිය ගැනුම්කරු වෙත පැවරී තිබුණද, එහි සන්තකය තවදුරටත් මිල නොලත් විකුණුම්කරු භාරයේම තිබේ නම්, එකී මිල ගෙවන තුරු එහි ගැනුම්කරු වෙත එම භාණ්ඩ නිදහස් කිරීම ( මුදා හැරීම ) ප්‍රතික්ෂේප කිරීමට මිල නොලත් විකුණුම්කරුවෙකුට ඇති අයිතිය ලියමේ අයිතිය නම් වේ.

මෙම අයිතිය මිල නොලත් විකුණුම්කරුවෙකුට පහත අවස්ථා වලදී හිමිවේ.

⇨ ණයට දීමක් අදහස් නොකොට භාණ්ඩ විකුණා ඇති විට

⇨ භාණ්ඩ ණයට විකුණා ඇතත්, අදාල ණය කාලසීමාව ඉක්මවා ඇති විට

⇨ ගැනුම්කරු වස්තු භංගත්වයට පත්ව ඇති විට

පහත අවස්ථා වලදී මිල නොලත් විකුණුම්කරුවෙකුට ලියමේ අයිතිවාසිකම අහිමි වේ.

⇨ භාණ්ඩ ඉවත් කිරීමේ අයිතිය තබා නොගෙන ගැනුම්කරු වෙත භාණ්ඩ රැගෙන යාම සඳහා ප්‍රවාහකයෙකුට භාර දි ඇති විට

⇨ ගැනුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් භාණ්ඩ වල සන්තකය නීත්‍යානුකූලව ලබා ගෙන ඇති විට

⇨ විකුණුම්කරු විසින් ලියමේ අයිතිය ප්‍රකාශිතවම අත්හැර දමා ඇති විට

## 2) සන්තරණයේදී නැවැත්වීමේ අයිතිය / මග නතර කිරීමේ අයිතිය / මාර්ගස්ථ නැවැත්වීමේ අයිතිය

ගැනුම්කරු වෙත ප්‍රවාහනය කිරීම සඳහා අදාල භාණ්ඩ ස්වාධීන ප්‍රවාහකයෙකුට භාර දීමත් සමගම මාර්ගස්ථව තිබියදී ( එනම්, භාණ්ඩය හෝ භාණ්ඩ ගැනුම්කරු වෙත ප්‍රවාහනය කරමින් තිබියදී ) ගැනුම්කරු බුන්වත් තත්වයට පත්ව ඇත්නම් එම භාණ්ඩ ගැනුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට භාර දීම නවතා එය නැවත ගෙනැවිත් තමා වෙත භාර දෙන ලෙසට මිල නොලත් විකුණුම්කරුවෙකු විසින් එකී ප්‍රවාහකයෙකුට නියම කල හැකිය. මෙසේ නියම කිරීමට මිල නොලත් විකුණුම්කරුට ඇති අයිතිය සන්තරණයේදී නැවැත්වීමේ ( මග නතර කිරීමේ ) අයිතිය ලෙස හැඳින්වේ.

මෙම අයිතිය මිල නොලත් විකුණුම්කරුට ක්‍රියාත්මක කල හැක්කේ , ගැනුම්කරු බුන්වත් තත්වයට පත්ව ඇත්නම් පමණි. භාණ්ඩ සැබවින්ම තමාගේ සන්තකයට ගැනීමෙන් හෝ තම

ඉල්ලීම අදාල ප්‍රවාහනකරු වෙත දැනුම් දීමෙන් මෙම අයිතිය මිල නොලත් විකුණුම්කරුට ක්‍රියාත්මක කල හැකිය.

## 3) භාණ්ඩ නැවත විකිණීමේ සීමිත අයිතිය

පහත සඳහන් අවස්ථා වලදී මිල නොලත් විකුණුම්කරුට මෙම අයිතිය ක්‍රියාත්මක කල හැකිය.

◆ භාණ්ඩ ඉක්මනින් නශ්‍ය වන සුලු ස්වභාවයේ පවතින විට

◆ භාණ්ඩ නැවත විකුණන බවට ගැනුම්කරු වෙත දන්වා තිබියදීත් ඉන් පසු සාධාරණ කාල සීමාවක් තුලදී එහි මිල නොගෙවා ඇති අවස්ථාවකදී

◆ විකුණුම්කරු ප්‍රකාශිතවම නැවත විකිණීමේ අයිතිය තබා ගෙන ඇති විට

## භාණ්ඩ විකිණීමේ නීතියට අදාල පසුගිය විභාග ප්‍රශ්ණ

## <u>භාණ්ඩ විකිණීමේ නීතිය - ප්‍රශ්ණ</u>

1.) පහත සඳහන් අවස්ථා භාණ්ඩ විකිණීමේ නීතියෙන් පාලනය වේද ?

I) කසුන් විසින් තමන්ගේ වෑන් රථය සුපුන්ට ලබාදෙන අතර සුපුන් විසින් ඒ වෙනුවට ඔහුගේ කාර් රථය ලබා දේ.

II) ඉහත අවස්ථාවේදී සුපුන් විසින් කසුන්ගේ වෑන් රථය ලබා ගෙන ඒ වෙනුවට තම කාර් රථය සහ මුදලින් රුපියල් ලක්ෂයක් ලබා දේ.

III) කසුන් විසින් මූල්‍ය සමාගමක් වෙතින් කුලී සින්නක්කර ක්‍රමයට කාර් රථයක් මිලදී ගනී.

IV) කසුන් විසින් තමන්ගේ වෑන් රථය සුපුන් වෙත තෑගි කරයි.

V) කසුන් විසින් තමන්ගේ වෑන් රථය සුපුන් වෙත රුපියල් ලක්ෂ 50 කට අත්පිට මුදලට විකුණයි.

VI) කසුන් විසින් තමන්ගේ වෑන් රථය සුපුන් වෙත රුපියල් ලක්ෂ 50 කට ණය පදනම මත විකුණයි.

VII) කසුන් සහ සුපුන් අද දින ගිවිසුමකට එළඹෙන්නේ ලබන ඉරිදාට කසුන්ගේ වෑන් රථය රුපියල් ලක්ෂ 50 ක අත්පිට මුදලකට සුපුන්ට විකිණීමටයි.

VIII) කසුන් සහ සුපුන් අද දින ගිවිසුමකට එළඹෙන්නේ ලබන ඉරිදාට කසුන්ගේ වෑන් රථය රුපියල් ලක්ෂ 50 කට ණය පදනම මත සුපුන්ට විකිණීමටයි.

IX) කසුන් විසින් ඔහු පදිංචි ඔහුට අයිති නිවස ලක්ෂ 50 කට සුපුන්ට මේ මොහොතේ විකිණීමට එකඟ වේ.

X) කසුන් විසින් ඔහු පදිංචි ඔහුට අයිති නිවස ලක්ෂ 50 කට සුපුන්ට ලබන ඉරිදා දිනයේදී විකිණීමට මේ මොහොතේ එකඟ වේ.

XI) කසුන් විසින් ඔහු සතුව ඇති විදේශ මුදල් නෝට්ටු 10 ක් සුපුන්ට ලබා දී ඒ සඳහා වර්තමාන විනිමය අනුපාතික යටතේ එහි වටිනාකම සුපුන් වෙතින් ලබා ගනී.

XII) කසුන් විසින් ඔහු සතුව ඇති ලන්දේසි යුගයට අයත් පෞරාණික කාසි 10 ක් සුපුන්ට ලබා දී ඒ සඳහා රුපියල් ලක්ෂයක් සුපුන් වෙතින් ලබා ගනී.

2) I) උපුල්ගේ කාර් රථය රුපියල් ලක්ෂ 50 කට විකිණීමට ඔහු විසින් නිමාලිට අර්පනයක් කරයි. ඇය විසින් එම අර්පනය ප්‍රතිග්‍රහණය කරන අතර, වැඩිදුරටත් දන්වා සිටින්නේ තමාගේ නිවසෙහි ගරාජයක් අලුතින් ඉදිකරන තෙක් එම කාර් රථය උපුල්ගේ නිවසෙහි ගාල් කර තබන ලෙසයි. උපුල් ඊට එකඟ වෙයි. දින කිහිපයකට පසු එම කාර් රථය රැගෙන යාමට පැමිණෙන නිමාලිට දැනගත හැකි වන්නේ එම රථය උපුල්ගේ වරදකින් තොරව අකුණු සැර වැදීමකින් එම

කාර් රථය මුලුමනින්ම විනාශ වී ඇති බවයි. අදාල පාඩුව විඳ දරා ගත යුත්තේ කවුරුන් විසින්ද යන්න විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

💣II) කාර් රථයේ හිමිකම නිමාලි වෙත හුවමාරු වන්නේ මුදල් ගෙවූ පසුව වන බවට දෙපාර්ශවය විසින් එකඟව තිබුනේ නම් සහ අකුණු සැර වදින මොහොත වන විට එම මිල ගෙවා නොමැති නම්, ඔබගේ ඉහත පිළිතුර කෙසේ වෙනස් වේද ?

💣3) I) කසුන් විසින් සුපුන් සමග ගිවිසුමකට එළඹෙන්නේ වායු සමීකරණ යන්ත්‍රයක් සුපුන්ගේ කාර්යාලයෙහි සවිකර බාර දීමටයි. දිනක් සවස් වරුවේ ගිවිසගත් වර්ගයෙන් වායු සමීකරණ යන්ත්‍රයක්ද රැගෙන එම කාර්යාලය වෙත යන කසුන්, එය සවි කර භාර දීමට පසු දින උදෑසන පැමිණෙන බව පවසමින් එම වායු සමීකරණ යන්ත්‍රය එහි තබා පිටව ගියේය. පසුවදා උදෑසන පැමිණෙන කසුන්ට දැක ගත හැකි වූයේ එම වායු සමීකරණ යන්ත්‍රය සුපුන්ගේ වරදකින් තොරව සොරුන් විසින් රැගෙන ගොස් ඇති බවයි. මෙහිදී අදාල පාඩුව විඳ දරා ගත යුත්තේ කවුරුන් විසින්ද යන්න විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

💣II) වායු සමීකරණ යන්ත්‍රයේ හිමිකම කසුන් වෙත හුවමාරු වන්නේ මුදල් ගෙවූ පසුව වන බවට දෙපාර්ශවය විසින් එකඟව තිබුනේ නම් සහ එය සොරා ගන්නා මොහොත වන විට එම මිල ගෙවා නොමැති නම්, ඔබගේ ඉහත පිළිතුර කෙසේ වෙනස් වේද ?

💣4) උපුල්ගේ කුඹුරෙන් මෙවර යල කන්නයේදී අස්වැන්න ලෙස ලබා ගත් වී තොගය කිලෝවක් රුපියල් 60 බැගින් අලෙවි කිරීමටත්, එම වී තොගය අදාල රථයට පටවන විට උපුල් විසින් එය කිරා ( weigh ) පැටවිය යුතු බවටත් එකඟ වෙමින් උපුල් සහ නිමාලි භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට එළඹුණහ. වී තොගය කිරා අවසන් වීමට ප්‍රථමයෙන් හදිසියේම ඇතිවූ සුනාමි තත්වයක් හේතුවෙන් එම වී තොගය වතුරට ගසා ගෙන ගොස් විනාශ විය.

💣I ) එම වී තොගය විනාශ වීමෙන් සිදුවන පාඩුව විඳ දරා ගත යුත්තේ කවුරුන් විසින් දැයි විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් දක්වන්න.

💣II) එකී ගිවිසුම ප්‍රකාරව වී තොගය කිරා පැටවීම සිදු කළ යුතුව තිබුණේ නිමාලි විසින් නම් ඔබගේ ඉහත ( I ) කොටසේ පිළිතුර කෙසේ වෙනස් වේද ?

💣III) එකී ගිවිසුම ප්‍රකාරව වී තොගයෙහි හිමිකම ගැනුම්කරු වෙත පැවරෙන්නේ එහි මිල ගෙවූ පසුව බවට දෙපාර්ශවය විසින් එකඟ වී තිබුනේ නම්, සහ එම වී තොගය විනාශ වන විට එම විකුණුම් මිල නිමාලි විසින් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කර ඇත්නම් අදාල පාඩුව විඳ දරා ගත යුත්තේ කවුරුන් විසින්ද ?

💣5) අමර විසින් නයනා වෙත මංගල සාරියක් යවමින් ඇයට දන්වා සිටින්නේ ඇය කැමති නම් එම සාරිය රැගෙන රුපියල් ලක්ෂයක් මුදලක් තමා වෙත ලබා දෙන ලෙස හෝ නැතිනම්, එය

2019.08.30 දාට පෙර තමන් වෙත නැවත ලැබෙන්නට සලස්වන ලෙසයි. පහත අවස්ථා වලදී එකී සාරියේ හිමිකම නයනා වෙත මාරු වී ඇත්දැයි සඳහන් කරන්න. අවශ්‍ය අවස්ථා වලදී විනිශ්චිත නඩු තීන්දු යොදා ගන්න.

I)නයනා විසින් එම රුපියල් ලක්ෂයක මුදල අමර වෙත යවයි.

II)නයනා විසින් එම සාරිය චමරීට විකුණයි.

III) නයනා විසින් එම සාරිය චමරීට උකස් කරයි.

IV) නයනා විසින් එම සාරිය අමර වෙත 2019.08.25 දින ආපසු යවයි.

V) නයනා විසින් එම සාරිය අමර වෙත 2019.09.25 දින ආපසු යවයි.

VI) නයනා විසින් එම සාරිය පිළිබඳව කිසිඳු දෙයක් අමර වෙත නොපවසා 2019.08.30 දින වන තෙක් මුදල් යැවීමක් හෝ සාරිය ආපසු යැවීමක් නොකරයි.

6) සාගර සතු තොග බඩු වෙළඳසැල වෙත යන ගංගා සාගරගෙන් සීනි මිටි 140 ක් මිලදී ගැනීමට ගිවිස ගත්තාය. ඒ වන විටත් සාගරගේ වෙළඳ සැල තුල සීනි මිටි 1000 ක් ගබඩා කොට තිබුණි. ගංගා විසින් අදාල මිල චෙක්පතක් මගින් ගෙවූ අතර තමා එම භාණ්ඩ රැගෙන යාමට සතියක් තුළ පැමිණෙන බවත් තමාගේ සීනි මිටි 140 වෙන්කර තමාට දන්වන ලෙසත් සාගරට දැන්වීය. සාගර විසින් දින කිහිපයකට පසුව ගංගා වෙත දන්වා සිටියේ අදාල සීනි මිටි 140 එම භාණ්ඩ විකිණීමේ ගිවිසුම වෙනුවෙන් වෙන් කොට ඇති බවත්, ඉන් මිටි 15 ක් තමාගේ වෙළඳසැලෙන්ද ඉතිරිය තමාගේ ගබඩාවෙන්ද ලබා ගත හැකි බව දැන්වීය. එම දැන්වීම ලද දිනට පසුදින සීනි රැගෙන යාමට පැමිණි ගංගාට දැනගත හැකි වූයේ සාගරගේ වෙළඳසැලේ තිබූ සීනි මිටි 15 සාගරගේ වරදකින් තොරව සොරුන් විසින් රැගෙන ගොස් ඇති බවයි. එම සීනි මිටි 15 නැතිවීමේ පාඩුව සාගර විසින් දරා ගත යුතු බව ගංගා විසින් සාගරට පවසයි. අසරණ සාගර ඔබගේ උපදෙස් පතයි. විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් සාගරට උපදෙස් දෙන්න.

7) සමන් විසින් තම මෝටර් රථය අලුත්වැඩියා කිරීම සඳහා උපුල් ට භාර දෙයි. උපුල් එය අලුත්වැඩියා කිරීම පසෙක ලා තම පෞද්ගලික පාවිච්චියට යොදා ගත් අතර එය හදිසි අනතුරකට භාජනය වූ පසු උපුල් විසින් එම රථය නිර්දෝෂී ගැනුම්කරුවකු වන මානෙල් ට විකුණන ලදී. මානෙල් විසින් පසුව එම රථය හොඳින් අලුත්වැඩියා කර නෙලුම් ට විකුණයි. විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරින් පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

I)වාහනය ආපසු ලබා ගැනීමේ අයිතියක් සමන් ට ඇත්ද ?

II)වාහනය අලුත්වැඩියා කිරීමට ගිය වියදම අය කර ගැනීමේ අයිතියක් මානෙල්ට තිබේද ?

III)ඉහත ( II ) කොටසට ඔබ විසින් ලබා දෙන පිලිතුර " ඔව් " නම් එම වියදම අයකර ගත හැක්කේ කාගෙන්ද ?

💣8) වෙන්දේසියකදී, වෙන්දේසිකරුවකු විසින් කාර් රථයක් නීල් ට විකුණයි. වෙන්දේසියේදී මිටිය පහත හෙලීමෙන් පසුව, දෙපාර්ශවය විසින් ගිවිසුමකට එළඹියේ වාහනයේ මිල සඳහා නීල් විසින් ලබා දුන් චෙක්පත නිශ්කාශනය වන තෙක් එම වාහනයේ අයිතිය නීල්ට හිමිනොවන බවටයි. චෙක්පත ලබාදී නීල් විසින් කාර් රථය රැගෙන ගිය අතර පසුව මෙම චෙක්පත අගරු විය. වාහනයේ හිමිකම නීල් වෙත මාරු වී ඇත්දැයි විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් පිළිතුරු දෙන්න.

💣9) ඒ විසින් බී සමග ගිවිසුමකට එළඹුනේ බී ගේ හෝටලයට මාසිකව ටොන් 125 බැගින් ඇපල් ටොන් 1500 ක් වසරක් පුරාවටම සපයන බවටයි. ගිවිසුම ප්‍රකාරව සපයනු ලබන ඇපල් වල ගුණාත්මකභාවය අඩු නම් ඒවා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ගැනුම්කරු සතු බව එම ගිවිසුමේ සඳහන් විය. බී වෙත එම ගිවිසුම ප්‍රකාරව ලබා දුන් මුල් ඇපල් ටොන් 750 නිශ්චිත ගුණාත්මක භාවයෙන් තොර බව අනාවරණය විය.

💣I)මෙම ගිවිසුම අවසන් කිරීමේ හැකියාවක් බී ට පවතීද ?

💣II)භාණ්ඩ කොටස් වශයෙන් භාර දෙන මෙවන් ගිවිසුම් වලදී එහි පාර්ශවයක් විසින් එම ගිවිසුමෙන් කොටසක් උල්ලංගනය කළහොත්, සමස්ත ගිවිසුම ම අවසන් කළ හැකිද, එසේත් නැතිනම් කඩවූ ප්‍රමාණයට පමණක් වන්දි ලබා ගෙන ගිවිසුම තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතුද යන්න තීරණය කිරීමේදී යොදා ගන්නා නිර්ණායක මොනවාද ?

💣10. අමාලි තම විවාහ දිනය වෙනුවෙන් වෙඩින් කේක් 600 ක් ඇණවුම් කිරීම සඳහා ඉල්මි වෙත යයි. එහිදී සාම්පල් කිහිපයක්ම පරීක්ෂා කරනු ලැබූ අතර ඒ අතර තිබූ මිල අධිකම සාම්පලයේ ආකාරයට වෙඩින් කේක් පෙට්ටි 600 ක් ඇණවුම් කළ අතර අමාලි විසින් වැඩිදුරටත් පවසා සිටියේ එම වෙඩින් කේක් තොගය පෙට්ටි 10 බැගින් අසුරා සකස් කළ පාර්සල් 60 ක් ලෙස එම වෙඩින් කේක් තොගය ලබා දෙන ලෙසත්ය. ඉල්මි ඊට එකඟ විය. මංගල දිනට පෙර දින එම කේක් තොගය රැගෙන ඒම සඳහා ඉල්මිගේ සාප්පුව වෙත අමාලි ගියාය. අමාලි එහි යන විටත් එම කේක් තොගය ලොකු පෙට්ටියක බහා පාර්සලයක ආකාරයෙන් සකසා තිබූ අතර එම තොගය , අදාල සාම්පලය සමග පරීක්ෂා කිරීමට අමාලි විසින් ඉල්ලා සිටිය නමුත් ඉල්මි විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ අතර ඉල්මි එකහෙලාම කියා සිටියේ එසේ පරීක්ෂා කිරීමට අනවශ්‍ය බවයි. එය රැගෙන නිවසට පැමිණ පරීක්ෂා කළ පසු ඇයට දැකගත හැකි වූයේ එම වෙඩින් කේක් තොගය තමා එකඟ වූ සාම්පලය ආකාරයේ නොව ඉල්මි සතුව ඇති මිල අඩුම සාම්පලය ආකාරයේ සුවඳ,පාට,පෙනුම, සහ රසය සහිත කේක් බවයි. තවද, මෙම මංගල උත්සවයට පැමිණි බොහෝදෙනා රෝගාතුර වූ අතර පසුව අනාවරණය වූයේ එම වෙඩින් කේක් වල තිබූ මනුෂ්‍ය ශරීරයට අහිතකර රසායන ද්‍රව්‍යක් හේතුවෙන් එම රෝගී වීම සිදුවූ බවයි.

මේ අතර අමාලි විසින් මෑතකදී මිලදී ගත් මෝටර් රථය ඇය වෙත විකුණු තැනැත්තා වන තුසිත එම මෝටර් රථයෙහි නියම හිමිකරු නොව තුසිත විසින් එම මෝටර් රථය සොරකකම් කර අමාලිට විකුණා ඇති බවයි.

මෙරට භාණ්ඩ විකිණීමේ නීතියට අදාලව මෙම සිදුවීම ආශ්‍රයෙන් අමාලි සම්බන්ධව කඩවී ඇති ව්‍යංග නියමයන් මොනවාද ?

💣11) ප්‍රභාත්ගේ ජංගම දුරකථනය රුපියල් පනස් දහසකට විකිණීම සඳහා කැලුම් වෙත අර්පනය කල අතර කැලුම් එම අර්පනය ප්‍රතිග්‍රහණය කලේය. නමුත් ඊට ඉතා සුලු මොහොතකට පසු එම ජංගම දුරකථනය කැලුම් වෙත ලබා දීමට පෙර එම දුරකථනය පුපුරා විනාශ වී ගියේය. මෙම දුරකථනය අහිමි වීම සම්බන්ධයෙන් පාඩුව විඳ දරා ගත යුත්තේ කවුරුන් විසින්ද ?

💣12) නියැදි පරීක්ෂාවකින් පසු ප්‍රතිපල සතුටුදායක වූයෙන් පවන විසින් ගගන ගෙන් කේක් කැබලි 200 ක් ඇණවුම් කර මිලයට ගත්තේය. පසුව සකුණ විසින් පවන ගෙන් ඉන් කේක් කැබලි දෙකක් මිලට ගෙන අනුභව කරන ලදී. එසේ ආහාරයට ගත් සැනින් සකුණ දැඩි සේ රෝගාතුර වූ අතර ඔහුව පරීක්ෂා කල විශේෂඥ වෛද්‍ය වරුන් ඇතුලු කණ්ඩායමක් විසින් සිදු කල පරීක්ෂණයකදී සැක හැර අනාවරණය වූයේ එම කේක් වල තිබූ විෂ රසායනිකයක් නිසා මෙම විපත සිදුවී ඇති බවයි. මෙම සිදුවීම සම්බන්ධයෙන් පවන සහ සකුණ ට භාණ්ඩ විකිණීමේ නීතිය යටතේ ලබා ගත හැකි සහන වෙන වෙනම ලියන්න.